# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1712/17 – 2011 ජුනි 30 වැනි බ්‍රහස්පතින්දා – 2011.06.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: උදු/2/5/2/56ඒ.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 13/97/එෆ්ආර්/151ඒ.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරඹකැටිය ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි වින්ඩ්පීල්ඩ් පාර්ක් වත්ත නම් වූ සර්වේයර් ජනරාල්ගේ අංක මහ 6142 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක 1 ප්‍රමාණයෙන් හෙක්. 0.1473, කැබලි අංක 2 ප්‍රමාණයෙන් හෙක්. 1.8683, කැබලි අංක 3 ප්‍රමාණයෙන් හෙක්. 4.8861 සහ කැබලි අංක 4 ප්‍රමාණයෙන් හෙක්. 8.0879ක් වූ මුලු ඉඩම් ප්‍රමාණය හෙක්. 14.9914ක් වූ ඉඩම් ප්‍රමාණය.

හිමිකම් කියන අය: එච්. එම්. ටී. ජී. පොඩිමැණිකේ මිය., කන්දේගම, උඩදුම්බර.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 අගෝස්තු මස 03 වැනි දින පෙ.ව. 10.00ට උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 අගෝස්තු මස 03 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩබ්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා,
ප්‍රාදේශීය ලේකම්,
උඩදුම්බර.

2011 ජුනි මස 14 වන දින,
උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 378

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ල/ප්‍රාලේ/313/5/2/33.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 13/00/එෆ්ආර්/60.

නකල්ස් සංරක්ෂණ කලාපයට අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලග්ගල උඩසිය පත්තුවේ පිටවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිටවල ගමේ පිහිට ගෝනමඩවත්ත ඉඩමේ සර්වේයර් ජනරාල් විසින් 2011.03.21 දිනැතිව පිළියෙල කරන ලද මූලික පිඹුරු මා 1543 හි කැබලි අංක 1, මුළු වර්ගඵලය හෙක්. 9.7650.

ඉඩමේ නම: ගෝනමඩවත්ත; විස්තරය: කැළෑව; හිමිකම් කියන අය: අතුරු ලියනගේ චන්ද්‍රපාල ගුණසිංහ, අංක 16, කෙන්සිටෙන් ගාර්ඩ්න්, කොළඹ 04; ප්‍රමාණය: හෙක්. 9.7650.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 අගෝස්තු මස 29 වැනි දින පෙ.ව. 10.00ට ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 අගෝස්තු මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

පී. ඒ. සරත්චන්ද්‍ර,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල-පල්ලේගම.

2011 ජූනි මස 06 වන දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 379

## ශුද්ධි පත්‍රිකාවයි

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ප්‍රාදේශීය ලේකම් යොමු අංකය: කහ/ප්‍රාලේ/ඉ/අත්පත්/01/03(01).
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 03ජේ/84/ඊ/440.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අංක 482/14 හා 1987.12.03 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද හිමිකම් පරීක්ෂණ දිනය හා වේලාව 1988.02.11 පෙ.ව. 10.30 වශයෙන් සඳහන් වුවද එය 2011.09.13 පෙ.ව. 10.30 යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දයානන්ද කොළඹගම,
ප්‍රාදේශීය ලේකම්,
කහවත්ත.

2011 ජූනි මස 20 වන දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කහවත්ත.

07 - 380

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.